# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/72 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

එල්.ඩී.බී. 1/77

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/6/1

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමන් විසින් සිදු කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

**රනිල් වික්‍රමසිංහ**

වෙනත් කරුණු අතර, ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරය සහ ශ්‍රී ලංකාවේ වෙනත් සමුද්‍රීය කලාප ප්‍රකාශයට පත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂංගික වූ වෙනත් සියලු කාරණා සඳහා ද, (මෙහි මින් මතු සමුද්‍රීය කලාප පිළිබඳ පනත යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනත ජාතික රාජ්‍ය සභාව විසින් පනවනු ලැබූ හෙයින් ද;

තව ද, ඉහත සඳහන් කරන ලද, සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2, 4, 5, 7 සහ 9 වන වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපතිතුමන් විසින් දේශීය මුහුදු තීරය, යාබද කලාපය, අනන්‍ය ආර්ථික කලාපය, අපවිත්‍ර කිරීම වැළැක්වීමේ කලාපය සහ ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජල ප්‍රදේශය ප්‍රකාශයට පත් කරමින් ප්‍රකාශනයක් කරනු ලැබ, එකී ප්‍රකාශනය 1977 ජනවාරි මස 15 වන දිනැති අංක 248/1 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ ඇති හෙයින් ද;

තව ද, සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපතිතුමන් විසින් ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකය සංයුක්ත වන ප්‍රදේශය හඳුනා ගනිමින් සහ එම මහාද්වීපික තටකයේ පිට ඉම නිරවද්‍යව නිශ්චය කරනු පිණිස ශ්‍රී ලංකාවේ පාදක රේඛා/ පාදක ලක්ෂ්‍යයන් ප්‍රකාශයට පත් කරමින් ප්‍රකාශනයක් කරනු ලැබ, එකී ප්‍රකාශනය 2012 අප්‍රේල් මස 18 වන දිනැති අංක 1754/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබඇති හෙයින් ද;

තව ද, වෙරළ තීරයේ ස්වාභාවිකව සිදුවන ලද වෙනස්කම් සහ මිනිසා විසින් සිදු කරන ලද සංවර්ධනයන් හේතුවෙන් 2012 අප්‍රේල් මස 18 වන දින අංක 1754/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රකාශනයේ සඳහන් I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ දක්වා ඇති ඇතැම් භූගෝලීය ඛණ්ඩාංක වෙනස් වී ඇති හෙයින් ද;

තව ද, සමුද්‍රීය කලාප පිළිබඳ පනතෙ ප්‍රකාරව ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපයන් නිරවද්‍යව නිශ්චය කරනු පිණිස ශ්‍රී ලංකාවේ නව පාදක රේඛා/ පාදක ලක්ෂ්‍යයන් හඳුනා ගැනීමට සහ ප්‍රකාශයට පත් කිරීමට දැන් අවශ්‍යව ඇති හෙයින් ද;

එසේ හෙයින්, පූර්වෝක්ත පනත ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාප නිශ්චය කිරීම සඳහා පාදක රේඛා/ පාදක ලක්ෂ්‍යයන් ගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අතර එම පාදක රේඛා/ පාදක ලක්ෂ්‍යයන් මෙහි I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ දක්වා ඇති භූගෝලීය ඛණ්ඩාංක මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු අතර,ඒ අනුව 2012 අප්‍රේල් මස 18 වන දින අංක 1754/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රකාශනයේ දක්වා ඇති I වන උපලේඛනය සහ II වන උපලේඛනය වෙනුවට එකී උපලේඛන ආදේශ කරනු ලැබිය යුතු ය.

වර්ෂ 2023 ක් වූ දෙසැම්බර් මස 21 වන දින කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ඊ. එම්. එස්. බී. ඒකනායක,**
ජනාධිපති ලේකම්.

I වන උපලේඛනය

***ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාප නිශ්චය කිරීම සඳහා වන පාදක රේඛා***

ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාප නිශ්චය කිරීම සඳහා වන පාදක රේඛා නිරූපණය කරනු ලබන්නේ දිවයින වටා පිහිටි වෙරළ රේඛාවෙන් සහ භූමි පිහිටීම අනුව යොදන ලද සෘජු භූමිතික රේඛා මගිනි.

ඒ අනුව, පාදක රේඛාව පවත්නා වෙරළ රේඛාව මගින් නිරූපණය වී ඇති 2-3, 4-5, 7-8, 9-10, 11-12, 22-23, 33-34, 35-36, 37-38, 39-40, 41-42, 43-44, 45-46, 50-51, 52-53, 54-55, 56-57, 68-69, 70-71 සහ 72-73 අතර දී හැර අනිකුත් සෑම පාදක ලක්ෂ්‍යයක් ම සෘජු භූමිතික රේඛා මගින් සම්බන්ධ කර ඇත.


| *පාදක ලක්ෂ්‍යයින් - **WGS 84,** ඉලිප්සාභයට අනුකූලවේ* | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| *නව ලක්ෂ්‍ය අංක* | *අක්ෂාංශ (උ)* | *දේශාංශ (නැ)* | *අක්ෂාංශ (උ)* | | | *දේශාංශ (නැ)* | | | *ස්ථානය* |
| | | | *අංශක* | *කලා* | *විකලා* | *අංශක* | *කලා* | *විකලා* | |
| 1 | 8.249753 | 79.738880 | 8 | 14 | 59.1 | 79 | 44 | 20.0 | නාවලඩි |
| 2 | 8.221336 | 79.702941 | 8 | 13 | 16.8 | 79 | 42 | 10.6 | කන්දකුලිය |
| 3 | 7.615697 | 79.797064 | 7 | 36 | 56.5 | 79 | 47 | 49.4 | දූදුරුඔය - උතුර |
| 4 | 7.607644 | 79.786320 | 7 | 36 | 27.5 | 79 | 47 | 10.8 | දූදුරුඔය - දකුණ |
| 5 | 7.274266 | 79.841673 | 7 | 16 | 27.4 | 79 | 50 | 30.0 | මහඔය - උතුර |
| 6 | 7.270913 | 79.841760 | 7 | 16 | 15.3 | 79 | 50 | 30.3 | මහඔය - දකුණ |
| 7 | 7.215167 | 79.815611 | 7 | 12 | 54.6 | 79 | 48 | 56.2 | ලිහිණිගල |
| 8 | 6.980064 | 79.869084 | 6 | 58 | 48.2 | 79 | 52 | 08.7 | කැලණිගඟ |
| 9 | 6.966000 | 79.830861 | 6 | 57 | 57.6 | 79 | 49 | 51.1 | කොළඹ වරාය 1 |

| පාදක ලක්ෂ්‍යයින් - ***WGS 84,*** ඉලිප්සාභයට අනුකූලවේ | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| නව ලක්ෂ්‍ය අංක | අක්ෂාංශ (උ) | දේශාංශ (නැ) | අක්ෂාංශ (උ) | | | දේශාංශ (නැ) | | | ස්ථානය |
| | | | අංශක | කලා | විකලා | අංශක | කලා | විකලා | |
| 10 | 6.957556 | 79.822639 | 6 | 57 | 27.2 | 79 | 49 | 21.5 | කොළඹ වරාය 2 |
| 11 | 6.940530 | 79.820388 | 6 | 56 | 25.9 | 79 | 49 | 13.4 | කොළඹ වරාය නගරය 1 |
| 12 | 6.922577 | 79.830656 | 6 | 55 | 21.3 | 79 | 49 | 50.4 | කොළඹ වරාය නගරය 2 |
| 13 | 6.705221 | 79.888974 | 6 | 42 | 18.8 | 79 | 53 | 20.3 | ගෝන ගල |
| 14 | 6.468833 | 79.964639 | 6 | 28 | 07.8 | 79 | 57 | 52.7 | යකඩ ගල |
| 15 | 6.420361 | 79.986833 | 6 | 25 | 13.3 | 79 | 59 | 12.6 | හඳරන් ගල |
| 16 | 6.193694 | 80.042111 | 6 | 11 | 37.3 | 80 | 02 | 31.6 | පාසි රොක් |
| 17 | 6.129064 | 80.095265 | 6 | 07 | 44.6 | 80 | 05 | 43.0 | වාල් දිවයින |
| 18 | 6.025389 | 80.197111 | 6 | 01 | 31.4 | 80 | 11 | 49.6 | අල ගල |
| 19 | 6.001222 | 80.246250 | 6 | 00 | 04.4 | 80 | 14 | 46.5 | දියඹ ගල - බටහිර |
| 20 | 6.001222 | 80.247083 | 6 | 00 | 04.4 | 80 | 14 | 49.5 | දියඹ ගල - නැගෙනහිර |
| 21 | 5.937444 | 80.449722 | 5 | 56 | 14.8 | 80 | 26 | 59.0 | මිරිස්ස |
| 22 | 5.919840 | 80.583973 | 5 | 55 | 11.4 | 80 | 35 | 02.3 | දෙවුන්දර තුඩුව 1 |
| 23 | 5.919845 | 80.594131 | 5 | 55 | 11.4 | 80 | 35 | 38.9 | දෙවුන්දර තුඩුව 2 |
| 24 | 5.927444 | 80.611694 | 5 | 55 | 38.8 | 80 | 36 | 42.1 | ගන්දර |
| 25 | 5.960000 | 80.722056 | 5 | 57 | 36.0 | 80 | 43 | 19.4 | නිල් වැල්ල |
| 26 | 5.970389 | 80.738694 | 5 | 58 | 13.4 | 80 | 44 | 19.3 | කොලොන්න |
| 27 | 6.070353 | 80.942033 | 6 | 04 | 13.3 | 80 | 56 | 31.3 | කලමැටිය |
| 28 | 6.180611 | 81.481472 | 6 | 10 | 50.2 | 81 | 28 | 53.3 | මහා රාවණ |
| 29 | 6.398861 | 81.727306 | 6 | 23 | 55.9 | 81 | 43 | 38.3 | කුඩා රාවණ |
| 30 | 6.765020 | 81.827808 | 6 | 45 | 54.1 | 81 | 49 | 40.1 | පානම කලපුව - දකුණ |
| 31 | 6.779461 | 81.824180 | 6 | 46 | 46.1 | 81 | 49 | 27.0 | පානම කලපුව - උතුර |
| 32 | 6.809955 | 81.824932 | 6 | 48 | 35.8 | 81 | 49 | 29.8 | බෝල්ට් පොයින්ට් |
| 33 | 6.822256 | 81.826138 | 6 | 49 | 20.1 | 81 | 49 | 34.1 | පසර්වේනයි |
| 34 | 6.836878 | 81.840270 | 6 | 50 | 12.8 | 81 | 50 | 25.0 | ආරුගම්බෙ - දකුණ |
| 35 | 6.871714 | 81.846059 | 6 | 52 | 18.2 | 81 | 50 | 45.8 | ආරුගම්බෙ - උතුර |
| 36 | 6.898699 | 81.845407 | 6 | 53 | 55.3 | 81 | 50 | 43.5 | කොටුකල් - දකුණ |
| 37 | 6.899476 | 81.845110 | 6 | 53 | 58.1 | 81 | 50 | 42.4 | කොටුකල් - උතුර |
| 38 | 6.955288 | 81.861307 | 6 | 57 | 19.0 | 81 | 51 | 40.7 | මුරුංගතැන කලපුව - දකුණ |
| 39 | 6.956408 | 81.861788 | 6 | 57 | 23.1 | 81 | 51 | 42.4 | මුරුංගතැන කලපුව - උතුර |
| 40 | 6.976119 | 81.865636 | 6 | 58 | 34.0 | 81 | 51 | 56.3 | කෝමාරි කලපුව - දකුණ |
| 41 | 6.977592 | 81.865213 | 6 | 58 | 39.3 | 81 | 51 | 54.8 | කෝමාරි කලපුව - උතුර |

| පාදක ලක්ෂ්‍යයින් - ***WGS 84,*** *ඉලිප්සාභයට අනුකූලවේ* | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| *නව ලක්ෂ්‍ය අංක* | *අක්ෂාංශ (උ)* | *දේශාංශ (නැ)* | *අක්ෂාංශ (උ)* | | | *දේශාංශ (නැ)* | | | *ස්ථානය* |
| | | | *අංශක* | *කලා* | *විකලා* | *අංශක* | *කලා* | *විකලා* | |
| 42 | 7.015456 | 81.876326 | 7 | 00 | 55.6 | 81 | 52 | 34.8 | තිම්බුටු කලපුව - දකුණ |
| 43 | 7.017652 | 81.877158 | 7 | 01 | 03.5 | 81 | 52 | 37.8 | තිම්බුටු කලපුව - උතුර |
| 44 | 7.092850 | 81.860167 | 7 | 05 | 34.3 | 81 | 51 | 36.6 | කෝරල් කලපුව - දකුණ |
| 45 | 7.093553 | 81.859702 | 7 | 05 | 36.8 | 81 | 51 | 34.9 | කෝරල් කලපුව - උතුර |
| 46 | 7.184796 | 81.861922 | 7 | 11 | 05.3 | 81 | 51 | 42.9 | සින්නමුහත්තුවරම් - දකුණ |
| 47 | 7.186417 | 81.861918 | 7 | 11 | 11.1 | 81 | 51 | 42.9 | සින්නමුහත්තුවරම් - උතුර |
| 48 | 7.275256 | 81.869844 | 7 | 16 | 30.9 | 81 | 52 | 11.4 | ඕලුවිල් |
| 49 | 7.319181 | 81.865681 | 7 | 19 | 09.1 | 81 | 51 | 56.5 | කල්‍යාණම්මඩු - දකුණ |
| 50 | 7.320828 | 81.865792 | 7 | 19 | 15.0 | 81 | 51 | 56.9 | කල්‍යාණම්මඩු - උතුර |
| 51 | 7.333047 | 81.863760 | 7 | 19 | 59.0 | 81 | 51 | 49.5 | අඩ්ඩාල්පල්ලම් |
| 52 | 7.333935 | 81.863615 | 7 | 20 | 02.2 | 81 | 51 | 49.0 | නින්දවූර් |
| 53 | 7.473459 | 81.816557 | 7 | 28 | 24.5 | 81 | 48 | 59.6 | පෙරියකල්ලාර් - දකුණ |
| 54 | 7.485047 | 81.813373 | 7 | 29 | 06.2 | 81 | 48 | 48.1 | පෙරියකල්ලාර් - උතුර |
| 55 | 7.760376 | 81.689509 | 7 | 45 | 37.4 | 81 | 41 | 22.2 | කොන්ඩාල් මුනයි |
| 56 | 7.761689 | 81.685472 | 7 | 45 | 42.1 | 81 | 41 | 07.7 | කච්චාන් මුනයි |
| 57 | 7.925669 | 81.576943 | 7 | 55 | 32.4 | 81 | 34 | 37.0 | වෙන්ඩ්ලුස් තුඩුව |
| 58 | 7.985389 | 81.559167 | 7 | 59 | 07.4 | 81 | 33 | 33.0 | වෙන්ගනම් මුනල් - දකුණ |
| 59 | 7.986611 | 81.558389 | 7 | 59 | 11.8 | 81 | 33 | 30.2 | වෙන්ගනම් මුනල් - උතුර |
| 60 | 7.994694 | 81.554694 | 7 | 59 | 40.9 | 81 | 33 | 16.9 | ඇතුගල |
| 61 | 8.422444 | 81.386944 | 8 | 25 | 20.8 | 81 | 23 | 13.0 | හෙමින්ග් රොක් |
| 62 | 8.500448 | 81.353692 | 8 | 30 | 01.6 | 81 | 21 | 13.3 | කොරල් තුඩුව |
| 63 | 8.721392 | 81.207102 | 8 | 43 | 17.0 | 81 | 12 | 25.6 | පුරමාලෙයි |
| 64 | 8.860611 | 81.085667 | 8 | 51 | 38.2 | 81 | 05 | 08.4 | පල්යක්තිකුලම් |
| 65 | 8.868670 | 81.079803 | 8 | 52 | 07.2 | 81 | 04 | 47.3 | බෝල්ඩර් පොයින්ට් |
| 66 | 8.940750 | 81.012806 | 8 | 56 | 26.7 | 81 | 00 | 46.1 | ශෝල්ඩර් පොයින්ට් |
| 67 | 9.289602 | 80.813178 | 9 | 17 | 22.6 | 80 | 48 | 47.4 | වඩ්ඩුවයික්කාල් |
| 68 | 9.313837 | 80.791642 | 9 | 18 | 49.8 | 80 | 47 | 29.9 | වෙල්ලමුලිවයික්කාල් |
| 69 | 9.418084 | 80.672577 | 9 | 25 | 05.1 | 80 | 40 | 21.3 | චලෙයි - දකුණ |
| 70 | 9.420594 | 80.669998 | 9 | 25 | 14.1 | 80 | 40 | 12.0 | චලෙයි - උතුර |
| 71 | 9.479192 | 80.595030 | 9 | 28 | 45.1 | 80 | 35 | 42.1 | චුන්ඩිකුලම් - දකුණ |
| 72 | 9.481778 | 80.592190 | 9 | 28 | 54.4 | 80 | 35 | 31.9 | චුන්ඩිකුලම් - උතුර |
| 73 | 9.825798 | 80.251664 | 9 | 49 | 32.9 | 80 | 15 | 06.0 | පේදුරුතුඩුව |

II වන උපලේඛනය

*ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාප නිශ්චය කිරීම සඳහා වන පාදක රේඛා සහ පාදක ලක්ෂ්‍ය සිතියම*




EOG 12 - 0350

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.